# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2446/26 – 2025 ජුලි මස 21 වැනි සඳුදා – 2025.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2022/167.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

පී.ඒ.ආර්. ජයසිංහ මහතා, අංක 45/A , ගාලු පාර, උතුරු පයාගල.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක. 130, ඩබ්ලිව්. ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර, අංක 117, සිරි සිංගප්පුලි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජුලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

1A – G 044906 – 14 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2022/167.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී.ඒ.ආර්. ජයසිංහ මහතා, අංක. 45/A , ගාලු පාර, උතුරු පයාගල.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්ලිව්. ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කළමනාකරණ සහකාර( විගණන ලිපිකරු) තනතුරෙහි සේවය කරන පී.ඒ.ආර්.ජයසිංහ මහතාට,

- 2021.05.11 දිනැති ලිපිය මගින් අමතර රාජකාරි පැවරුමක් ලෙස ගිණුම් නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ආවරණය සඳහා මාර්ග හා පාලම් අංශය වෙත ස්ථාන මාරු කිරීම.
- 2021.06.02 දින සිට නැවත අභ්‍යන්තර විගණන අංශය වෙත ස්ථාන මාරු කරනු ලැබ ඇතත් එහි සේවය කිරීමට අවස්ථාව නොදීම.
- 2021.06.07 දින සිට නැවත මානව සම්පත් හා පාලන අංශය වෙත අනුයුක්ත කිරීම.
- 2021.06.21 දින කළුතර මාර්ග සංවර්ධන වැඩ බිම වෙත ස්ථාන මාරු කිරීම.
- තනතුරට පරිබාහිර රාජකාරිවල යෙදවීම.

යනාදී ක්‍රියාවන් මඟින් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්.කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0241

---

මගේ අංකය: IR/COM/03/2020/235.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2024.09.15 වැනි දින අංක 2297/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.05 වැනි දින දරන නියෝගයෙන්,

කේ.ඒ.එන්.ප්‍රේමසිරි මයා, ජී.55 , ටොරින්ටන් මහල් නිවාස, ටොරින්ටන් මාවත, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

අතර පවත්නා 2022.08.31 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ කුමාරසිංහ අමරනාත් පෙරේරා රාජකරුණා මහතා බේරුම්කරණ ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2022.09.05 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජුලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

EOG 07 – 0242/1

---

මගේ අංකය: IR/COM/03/2020/235.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ.ඒ.එන්.ප්‍රේමසිරි මයා, ජී.55 , ටොරින්ටන් මහල් නිවාස, ටොරින්ටන් මාවත, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, බුද්ධාලොක පාර, අංක 40, ආචාර්ය කේ.ඒ.තිලකරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජුලි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/235.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ.ඒ.එන්.ප්‍රේමසිරි මයා, ජී.55, ටොරින්ටන් මහල් නිවාස, ටොරින්ටන් මාවත, කොළඹ 05.

සහ

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අතිරේක අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරමින් සිට 2018.06.20 දින විශ්‍රාම ගිය කේ .ඒ.එන්. ප්‍රේමසිරි මහතාට පහත සඳහන් කරුණු මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේනම් හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.

1. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂවරුන් MM1 -1 වැටුප් පියවරේ සිට HM වැටුප් පියවරේ පිහිටුවන ලද 2018.05.14 දින සිට කේ.ඒ.එන්.ප්‍රේමසිරි මහතා විශ්‍රාම ගිය 2018.06.20 දින දක්වා කාලය සඳහා හිඟ වැටුප් හා දීමනා හිමි ද යන්නත් හිමිනම් එය ලබා නොදීම.

2. වෘත්තීය දීමනා හිඟ මුදලක් තිබේ ද යන්නත් තිබේ නම් එය ලබා නොදීම. "

**එච්. එම්.ඩී.එන්. කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0242/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.